# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1464/5 - 2006 සැප්තැම්බර් 25 වන සඳුදා - 2006.09.25**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. - 8/96

**1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත**

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ 31 වන වගන්තිය යටතේ සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඒ.පී. ජගත් පුෂ්පකුමාර,
සමාජ සේවා සමාජ සුභසාධන වැඩබලන අමාත්‍ය

2006 සැප්තැම්බර් මස 22 වැනි දින
කොළඹදීය.

**නියෝග**

1. මෙම නියෝග 2006 විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම නියෝග යනුවෙන් සඳහන් කරනු ලැබේ.
2. පනතේ 4 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් පිහිටුවනු ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ("මෙහි මින් මතු යෝජනා ක්‍රමය" යනුවෙන් හඳුන්වනු ලබන) , පහත සඳහන් විවිධ සැලසුම් මඟින් සමන්විත වන්නේය :-

(අ) මෙහි "අ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "සහන" සැලසුම,
(ආ) මෙහි "ඇ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "තිළිණ" සැලසුම,
(ඇ) මෙහි "ඈ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "ඉසුරු" සැලසුම,
(ඈ) මෙහි "ඉ"උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "සරණ" සැලසුම,
(ඉ) මෙහි "ඊ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "සුරැකුම" සැලසුම, සහ
(ඊ) මෙහි "උ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් "ධනලක්ෂ්මී" සැලසුම.

3. පනත අදාළ වන තැනැත්තකුට "සහන", "තිළිණ", "ඉසුරු" හෝ "සරණ", යන විවිධ සැලසුම් වලින් එක් සැලසුමකට තමාගේ මනාපය පරිදි දායක වීමේ හැකියාව ඇති අතර, "සුරැකුම" සහ "ධනලක්ෂ්මී" යන සැලසුම් සඳහා දායක වන්නන්ට, තමාගේ මනාපය හා හැකියාව අනුව එයින් එක් සැලසුමකට හෝ සැලසුම් දෙකටම හෝ දායක වීමේ හැකියාව ඇත. දායකවීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයෙහි, තමා දායක වීමට මනාප සැලසුම් ක්‍රමය කුමක්ද යන්න සඳහන් කළ යුතුය.

4. පනත අදාළ තැනැත්තන් විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා නොසිටීම හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නොදැරීම, මෙම යෝජනා ක්‍රමයේ දායකයකු වීමට සුදුසුකමක් වේ.

5. 4 වන නියෝගයෙහි සඳහන් සුදුසුකම්වලට අමතරව, "සහන" සැලසුම හෝ "තිළිණ" සැලසුමට දායක වීමට මනාපය දක්වන තැනැත්තන් පහත සඳහන් සීමාවන්ට යටත්විය යුතුය. එනම් :-

(අ) "සහන" සැලසුමට දායකවීමට රු. 36,000 ට අඩු වාර්ෂික අදායමක් හෝ "තිළිණ" සැලසුමට දායකවීම රු. 72,000 ක් නොඉක්මවන වාර්ෂික අදායමක් හෝ පෙන්නුම් කිරීම ;

(ආ) අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභයකට හිමිකමක් ලබන රැකියාවක දායකයා තත්කාලයේ සේවයේ නියුක්තව නොසිටීම ; සහ

(ඇ) ඉහත (අ) ජේදයෙහි සඳහන් ආදායම් තත්වය පිළිබඳව අදාළ කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර තිබීම.

6. (1) යෝජනා ක්‍රමයට දායකවීමට මනාප සෑම තැනැත්තකු විසින්ම, මණ්ඩලය විසින් අනුමත කරන ලද ආකෘතියකට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් බලයලත් නිලධරයකු වෙත පහත සඳහන් දායක මුදල ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(අ) "සහන" සැලසුමෙහි දායකත්වය ලබා ගැනීමට මනාපය පළ කරන යම් තැනැත්තකු විසින්, 'අ' උපලේඛනයේ I වන තීරුවෙහි නිශ්චිතව සඳහන් වයසකදී එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ත්‍රෛමාසික වාරික හෝ එම උපලේඛනයේ IV තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් එකවර ගෙවන මුදල ;

(ආ) "තිළිණ", "ඉසුරු" හෝ "සරණ" සැලසුම්වල දායකත්වය ලබාගැනීමට මනාපය පළ කරන යම් තැනැත්තෙකු විසින්, "ඈ", "ඈ" හෝ "ඉ" යන උපලේඛනවල I වන තීරුවේ නිශ්චිතව සඳහන් වයසකදී එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මාසික වාරික හෝ උපලේඛනවල IV තීරුවෙහි අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් එකවර ගෙවන මුදල ; හෝ

(ඇ) "සුරැකුම" සැලසුමෙහි හෝ "ධනලක්ෂ්මී" සැලසුමෙහි දායකත්වය ලබා ගැනීමට මනාපය පළ කරන යම් තැනැත්තෙකු විසින් "ඊ" හෝ "උ" උපලේඛනවල I වන තීරුවේ නිශ්චිතව සඳහන් වයසකදී එහි II වන තීරුවේ නිශ්චිතව සඳහන් මාසික විශ්‍රාම වැටුප හෝ එහි ගුණිතයක් ලබාගැනීම සඳහා, III වන තීරුවේ සඳහන් මාසික වාරිකය, IV තීරුවේ සඳහන් ත්‍රෛමාසික වාරිකය, V වන තීරුවේ සඳහන් වාර්ෂික වාරිකය, VI වන තීරුවෙහි සඳහන් වාර්ෂික වාරිකය, VII වන තීරුවේ සඳහන් වාර්ෂික වාරිකය, VIII වන තීරුවේ සඳහන් වාර්ෂික වාරිකය, IX වන තීරුවේ සඳහන් වාර්ෂික වාරිකය හෝ X තීරුවේ සඳහන් එකවර ගෙවන වාරිකය හෝ එහි ගුණිතයන්.

(2) "අ", "ඇ", "ඈ" හෝ "ඉ" උපලේඛනවල IV වන තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති එකවර ගෙවන මුදල ගෙවීමට මනාපය පළ කරන යම් තැනැත්තෙකුට, තම මනාපය පරිදි එම එකවර ගෙවන මුදල ඒ එක් එක් උපලේඛයේ අනුරූපී V වන තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට වාර කොටස් ගණනකින් පළමුවන වාරිකය ගෙවූ දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවිය හැකිය.

7 "සහන" සැලසුමෙහි හෝ "තිළිණ" සැලසුමෙහි දායකත්වය ලබා ගන්නා තැනැත්තකු වෙනුවෙන් වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට අනුග්‍රාහකත්වයක් ලබා දිය හැකිය.

8 යෝජනා ක්‍රමයට දායකවීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබුණුවිට, බලයලත් නිලධරයා විසින් ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව ඉල්ලුම්කරු විසින් සපයන ලද තොරතුරුවල සත්‍යතාවය තහවුරු කරගත යුතු අතර, ඉල්ලුම්පත්‍රය ලැබී දින තිහක් ඇතුළත එම ඉල්ලුම්පත්‍රය සහ ඔහුගේ නිර්දේශය ඉල්ලුම්කරු විසින් ගෙවන ලද දායක මුදල සමඟ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

9 (1) මණ්ඩලය විසින් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම්පත්‍රයකයකට සිය අනුමැතිය දෙන අවස්ථාවක දී එකී මණ්ඩලය විසින් ඔහු යෝජනා ක්‍රමයේ දායකයෙකු වශයෙන් බඳවා ගත යුතුය. ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන අවස්ථාවකදී, එකී මණ්ඩලය විසින් එම තීරණය ඔහුට දැනුම්දිය යුතු අතර, ඔහු විසින් ගෙවන ලද දායක මුදල වහාම ඔහු වෙත ආපසු යැවිය යුතුය.

(2) ඉල්ලුම්කරුවකු යෝජනා ක්‍රමයේ දායකයෙකු වශයෙන් බඳවාගන්නා අවස්ථාවක දී, ඔහු විසින් ගෙවිය යුතු දායක මුදල, ඊට අදාළ නියම සහ කොන්දේසි සහ එම ඔප්පුව යටතේ ඔහු හිමිකම් ලබන ප්‍රතිලාභ සඳහන් වන ඔප්පුවක්, මණ්ඩලය විසින් පනතෙහි 14 වගන්තියට අනුව ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

10 (1) මාසික, ත්‍රෛමාසික හෝ වාර්ෂික වාරික ගෙවීමකට මනාපය පළ කරන සෑම දායකයෙකු විසින්ම ඔහුට නිකුත් කරනු ලැබ ඇති ඔප්පුවේ නියම කර ඇති නියමිත දිනයට හෝ ඊට පෙර එම වාරික මුදල් ගෙවිය යුතුය. එසේ වුවද, යම් මාසික, ත්‍රෛමාසික හෝ වාර්ෂික වාරිකයන් ගෙවීම සඳහා එක් මසක අනුග්‍රාහක කාලසීමාවක් දෙනු ලැබිය හැකි අතර, වාරික ගෙවීම අනුග්‍රාහක කාලසීමාවෙන් පසු සිදුවී ඇත්නම්, එම කාලසීමාව තුළදී මණ්ඩලයට අහිමිවූ එම ගෙවිය යුතුව තිබූ වාරික මුදලට අදාළ පොළිය, දායකයා විසින් වාරිකයට අමතරව ගෙවිය යුතු වන්නේය.

(2) දායකයෙකු විසින් වාරික කවර හෝ ගණනක් කලින් ගෙවිය හැකි අතර, ඒ සඳහා කලින් කලට බලපවත්වන පොළී අනුපාතයන්ට අනුව ප්‍රතිදානයක් හිමිකර ගැනීමටද, දායකයෙකුට හැකියාවක් ඇත.

11 යම් දායකයෙකු විසින් ගෙවිය යුතු වූ වාරික අනුග්‍රාහක කාල සීමාව ඇතුලත ගෙවනු ලබන්නේ නම්, ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රමාණයේ ගැලපීමක් නොකළ යුතුය. එහෙත් වාරිකය අනුග්‍රාහක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව 10 (1) වන නියෝගයෙහි සඳහන් වූ පොලිය සමඟ ගෙවා නොමැති නම්, හිඟ වාරික සහ අයවිය යුතු පොළිය සමුච්චිත ගිණුම් ශේෂයෙන් අඩුකර, ශුද්ධ සමුච්චිත ගිණුම් ශේෂයට යටත්ව, මෙහි 13 (2) වන නියෝගය යටතේ ගෙවිය හැකි උපරිම විශ්‍රාම වැටුප ගෙවිය යුතු ය.

12 (1) (අ) දායකවීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයේ යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් අඩංගු බව හෝ යම් වැදගත් තොරතුරක් හෙළි නොකර ඇති බව සොයා ගනු ලැබුවහොත් ; හෝ

(ආ) යෝජනා ක්‍රමයට බැඳීමට දායකයාට තිබිය යුතුවූ සුදුසුකම්, එසේ බඳවාගැනීමෙන් අනතුරුව නතර වුවහොත්, බඳවා ගැනීමේදී දායකයාට නිකුත් කරනු ලැබූ ඔප්පුව මණ්ඩලය විසින් අවලංගු කළ හැකිය.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ මණ්ඩලය විසින් දායකයෙකුගේ ඔප්පුව අවලංගු කළ අවස්ථාවකදී :-

(අ) දායකයා විසින් ගෙවා ඇති යම් ශුද්ධ දායක මුදලක් ඇත්නම් එදින වන විට මණ්ඩලය ඉපයූ පොළී අනුපාතයෙන්, ඒකක දෙකක් අඩුකර ලැබෙන පොලී අනුපාතයට අනුව ගණනය කළ පොළියද සමඟ එම මුදල ආපසු ගෙවිය යුතුය ; නැතහොත්

(ආ) ඔහු අළුත් දායකයෙකු වශයෙන් නැවත බඳවාගනු ලැබිය හැකි අතර, එවිට ඔහු විසින් කළින් ගෙවන ලද ශුද්ධ දායක මුදල ඔහු විසින් ගෙවිය යුතු වාරිකවලට හිලව් කළ හැකිය.

(3) (1) පනතේ 15 (1) ඡේදය යටතේ මණ්ඩලය විසින් දායකයෙකුගේ ඔප්පුවක් අවලංගු කළ විටකදී, ඒ වන විට එම දායකයා විසින් ගෙවිය යුතු වාරික සංඛ්‍යාවෙන් සියයට විසිපහකට වඩා ගෙවා තිබුණේ නම්, ශුද්ධ දායක මුදල ඔහුට ආපසු ගෙවිය යුතුය.

13 (1) 6 වන නියෝගය යටතේ සියලු මාසික, ත්‍රෛමාසික, වාර්ෂික හෝ එකවර ගෙවන ලද දායක මුදල් සම්පූර්ණයෙන් ගෙවා ඇති දායකයෙකුට, අවස්ථෝචිත පරිදි, තම මනාපය අනුව යෝජනා ක්‍රමයට බැඳුන පදනම මත :-

(අ) "අ", "ඇ", "ඈ", හෝ "ඉ" උපලේඛනවල VI වන තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති මාසික විශ්‍රාම වැටුප, හෝ

(ආ) "ඊ", හෝ "උ" උපලේඛනවල II වන තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති මාසික විශ්‍රාම වැටුප හෝ එහි ගුණිතයක්, ලබාගැනීමට හිමිකමක් ඇත්තේය.

(2) යම් දායකයෙකු මණ්ඩලය විසින් තමා වෙත නිකුත් කරනු ලැබ ඇති ඔප්පුවේ ඇතුළත් නියමවලට අනුව ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවට අඩු, එහෙත් එම සංඛ්‍යාවෙන් සියයට හැත්තෑපහකට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ඔහු විසින් මණ්ඩලය වෙත ගෙවා ඇති දායක මුදල්වලට සමානුපාතික මාසික විශ්‍රාම වැටුපක්, දායකයාට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇති දින සිට ලබා ගැනීමට හිමිකම ඇත්තේය.

(3) යම් දායකයෙකු මණ්ඩලය විසින් තමා වෙත නිකුත් කරනු ලැබ ඇති ඔප්පුවේ නියම වලට අනුව ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් සියයට විසිපහකට වැඩි එහෙත් එම සංඛ්‍යාවෙන් සියයට හැත්තෑපහකට අඩු ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, දායකයාගේ ඉල්ලීම අනුව ඔහු විසින් මණ්ඩලය වෙත ගෙවා ඇති ශුද්ධ දායක මුදල් ප්‍රමාණය, ඒ දින වන විට මණ්ඩලය උපයා ඇති පොළී අනුපාතයෙන් ඒකක දෙකක් අඩුකර ලැබෙන අනුපාතයට අනුව ගණනය කළ පොළියද සමඟ, ඔහුට ආපසු ලබාගැනීමට හිමිකම ඇත්තේය.

(4) යම් දායකයෙකු මණ්ඩලය විසින් තමා වෙත නිකුත් කරනු ලැබ ඇති ඔප්පුවේ නියමවලට අනුව ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් සියයට විසි පහකට අඩු සංඛ්‍යාවක් ගෙවීමෙන් අනතුරුව තවදුරටත් දායක මුදල් ගෙවීමට අපොහොසත් වී ඇත්නම්, දායකයා විසින් ඒ වන විට ගෙවන ලද දායක මුදල් මණ්ඩලය සතු වන්නේය.

14 (1) යෝජනා ක්‍රමයේ කිසියම් සැලසුමක දායක වූ සියළුම තැනැත්තන්ට, යෝජනා ක්‍රමයට යම් අතිරේක දායක මුදලක් නොගෙවා අබලතා ප්‍රතිලාභයකට සහ මරණ පාරිතෝෂිකයකට හිමිකමක් ලැබිය හැකිය.

(2) "ඉසුරු", "සරණ", "සුරැකුම" හෝ "ධනලක්ෂ්මී" යන ඕනෑම සැලසුමක දායකත්වය ලබාගන්නා තැනැත්තෙකුට එම සැලැස්මට අනුව, දායකත්වය ලබා නිශ්චිත කාලයකට පසු සහ අඛණ්ඩව වාරික ගෙවා ඇති විට, සමුච්චිත ගිණුම් ශේෂය මෙන්ම, කලින් කල අරමුදල පිළිබඳව කරනු ලබන ජීව ගණක තක්සේරුව යන සියලුම කරුණු සැලකිල්ලට ගෙන, (1) වන ඡේදයේ සඳහන් ප්‍රතිලාභ වලට අමතරව, වෙනත් අතිරේක ප්‍රතිලාභ ලැබීමට ද, හිමිකමක් ඇත.

15. අබලතා ප්‍රතිලාභ වර්ග දෙකක් ඇති අතර, ඒවා පහත දැක්වෙන පරිදි වේ. :

(අ) ස්ථිර වශයෙන්ම අර්ධ ආබාධිත තත්වයකදී ගෙවන පාරිතෝෂික ; සහ

(ආ) ස්ථිර වශයෙන්ම පූර්ණ ආබාධිත තත්වයකදී ගෙවන පාරිතෝෂික.

16. හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන්, යම් දායකයකු -

(අ) අත්දෙකම නැතිවීමෙන් හෝ අත්දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් ;

(ආ) පා දෙකම නැතිවීමෙන් හෝ පා දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්;

(ඇ) ඇස් දෙකේම පෙනීම නැතිවීමෙන් ;

(ඈ) එක් අතක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් සහ එක් පාදයක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් ;

(ඉ) එක් අතක් හෝ පාදයක් නැතිවීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් හෝ එක් පාදයක් හෝ අතක් ස්ථිර වශයෙන් අබලතාවට පත්වීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් ; හෝ

(ඊ) බෙල්ලෙන් පහල පූර්ණ පක්ෂඝාතයකට ලක්වීමෙන්, පීඩාවකට පත්වන අවස්ථාවක මෙම නියෝගවල කාර්ය සඳහා දායකයා ස්ථිර වශයෙන්ම පූර්ණ ආබාධිත තත්වයකට පත්වූවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

17. යම් හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන්, යම් දායකයෙකු -

(අ) එක් ඇසක පෙනීම නැතිවීමෙන් ;

(ආ) එක් අතක් නැතිවීමෙන් හෝ එක් අතක් ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් ; හෝ

(ඇ) එක් පාදයක් නැතිවීමෙන් හෝ එක් පාදයක් ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්,

පීඩාවකට පත්වන අවස්ථාවක මෙම නියෝගවල කාර්ය සඳහා දායකයා ස්ථිර වශයෙන් අර්ධ අබාධිත තත්වයකට පත්වූවකු ලෙස සලකනු ලැබිය යුතුය.

18 (1) මේ නියෝගවල "ආ" උපලේඛනයේ I වන තීරයේ සඳහන් වයස් කණ්ඩායම් අතුරෙන් යම් කණ්ඩායමකට ඇතුළත් දායකයෙකු එහි II වන තීරයේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත -

(අ) ස්ථිර වශයෙන් පූර්ණ ආබාධිත තත්වයට පත්වීමෙන් පීඩාවට පත්වූ විට, II වන තීරයේ සටහනට අනුරූපී III වන තීරයේ සඳහන් එකවර ගෙවන පාරිතෝෂිකය ලැබීමට දායකයාට හිමිකම ලැබිය යුතුය. නැතහොත්, දායකයාගේ මනාපය පරිදි, ඒ අබාධිත තත්වයට පත් වූ දිනයේ සිට ඔහුට මාසික දීමනාවක් ලබාගත හැකි අතර, එම දිමනාව "අ", "ඇ", "ඈ" හෝ "ඉ" උපලේඛනවල VI වන තීරයේ සඳහන් මාසික විශ්‍රාම වැටුප හෝ "ඊ", "උ", උපලේඛනවල II වන තීරයේ සඳහන් මාසික විශ්‍රාම වැටුප හෝ එහි ගුණිතයක් විය යුතුය. එසේ ගෙවනු ලබන එම මාසික විශ්‍රාම වැටුප, පනතේ 8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන්, නියත කාලීන දීමනාව වශයෙන් සලකනු ලැබේ. ;

(ආ) ස්ථිර වශයෙන්ම අර්ධ ආබාධිත තත්වයකට පත්වීමෙන් පීඩාවට පත් වූ විට "ආ" උපලේඛනයේ II වන තීරයේ සටහනට අනුරූපී IV වන තීරයේ සඳහන් එකවර ගෙවන පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන්නේය ; නැතහොත්

(ඇ) මරණයට පත්වූ විට "ආ" උපලේඛනයේ I වන තීරයේ සටහනට අනුරූපී V වන තීරයේ සඳහන් එකවර ගෙවන පාරිතෝෂිකය ලැබීමට ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන් හිමිකම් ලබන්නේය ;

(2) "තිළින", "ඉසුරු", "සරණ", "සුරැකුම" හෝ "ධනලක්ෂ්මී" යන සැලසුම්වලට දායක වූ තැනැත්තෙකු ස්ථිර පූර්ණ අබලතාවයකට, ස්ථිර අර්ධ අබලතාවයකට හෝ මරණයට පත්වන අවස්ථාවක පාරිතෝෂික ගෙවීමේදී "ආ" උපලේඛනයේ II වන තීරුවේ සටහනට අනුරූපී III වන, IV වන හා V තීරුවල සඳහන් එකවර ගෙවනු ලබන පාරිතෝෂිකය සහ දායකයා විසින් ගෙවන ලද ශුද්ධ දායක මුදල පොලියද සමඟ ලබාගැනීමට දායකයාට හෝ දායකයාගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට හිමිකම් ලැබිය යුතුය. එසේ වුවද, ස්ථිර අර්ධ අබලතාවයකදී විශ්‍රාම වැටුප ලබාගැනීමට ඔහු රැඳී සිටින්නේ නම් ඔහු හට ශුද්ධ දායක මුදල ගෙවනු නොලැබේ.

19. 16 සහ 17 වන නියෝගයන්හි සඳහන් යම් සිද්ධියක් සිදුවූ විටක, මෙම නියෝගවල "ආ" උපලේඛනයේ සඳහන් එකවර ගෙවනු ලබන පාරිතෝෂිකය, අවස්ථාවෝචිත පරිදි දායකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට, එක් වරක් පමණක් ගෙවනු ලබන්නේය. එසේ වුවද, අර්ධ ආබාධිත පාරිතෝෂිකයක් ලබා පනතේ II වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි යෝජනා ක්‍රමයේ දිගටම රැඳී සිටින දායකයකු, විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා හිමිකම් ලැබීමට පෙර සම්පූර්ණ ආබාධිත තත්වයට පත් වන අවස්ථාවක, පූර්ණ ආබාධිත තත්වයට පත් වූ දිනයේ දී ගෙවිය යුතු සම්පූර්ණ ආබාධිත පාරිතෝෂිකය හා ගෙවන ලද අර්ධ ආබාධිත පාරිතෝෂිකය අතර වෙනස, දායකයාට ගෙවනු ලබන්නේය.

20. යම් දායකයෙකු හෝ ඔහුගේ නීත්‍යානුකූල උරුමකරු, අවස්ථාවෝචිත පරිදි අබලතාව හෝ මරණය සඳහා වූ එකවර ලැබෙන පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන විටකදී, තමාට එකී හිමිකම ලැබීමට මුල්වූ සිද්ධිය පිළිබඳව ඔහු හෝ ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන් විසින්, ඒ සිද්ධිය සිදුවීමෙන් දින අනුවක් (90) ඇතුළත මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

21. (1) ඔප්පුව නිකුත් කළ දිනයේ සිට මාස දොලහක් ඇතුළත දායකයකුට සිදුවන අබලතාවක් හෝ මරණය හදිසි අනතුරක ප්‍රතිඵලයක් නිසා සිදුවේ නම් පමණක් එකී අබලතාවය හෝ මරණය සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම දායකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුහට එකවර ලැබෙන පාරිතෝෂිකයට හිමිකම ලැබෙන්නේය.

(2) ඔප්පුව නිකුත් කළ දිනයේ සිට මාස දොලහක් ඇතුළත යම් දායකයෙකු ස්වාභාවික හේතූන් කරණ කොට ගෙන මියගියහොත්, ඔහු විසින් ගෙවිය යුතු ව තිබූ වාරික සංඛ්‍යාවෙන් සියයට පනහකට වඩා ඒ වන විට ඔහු ගෙවා ඇත්නම්, රුපියල් පන්දහසක් නොඉක්මවන කරුණා සහගත ගෙවීමක් සහ ඔහු විසින් ගෙවන ලද ශුද්ධ දායක මුදල ලබාගැනීමට, ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට හිමිකම් ලැබෙන්නේය.

22. යෝජනා ක්‍රමයේ යම් දායකයෙකු සිය දිවි හානි කර ගැනීමට තැත් කිරීමෙන් හෝ තමා විසින්ම සිදු කරගත් තුවාල නිසා අබලතාවයකට පත්වූ විටක, ඔහුට මෙම නියෝග යටතේ එකවර ලැබෙන ආබාධිත පාරිතෝෂිකයට හිමිකම් නොලබන්නේය.

23 යම් දායකයෙකුගේ අබලතාවය හෝ මරණය සිදුවූයේ :-

(අ) ප්‍රකාශිත හෝ අප්‍රකාශිත යුද්ධයකදී, සිවිල් යුද්ධයකදී , කැරැල්ලකදී, විප්ලවයකදී හෝ රාජ්‍ය විරෝධී කැරැල්ලකදී, ආක්‍රමණයකදී, පරසතුරු කටයුතුවලට එරෙහිව නිරතවූ කටයුත්තකදී ;

(ආ) පිළිගත් ගුවන් සේවයක ගාස්තු නොගෙවූ මගියෙකු වශයෙන් ගුවන් ගමන් හෝ ගුවන් නැව් හෝ වෙනත් යම් ආකාරයක ගුවන් ගමනක නිරතවෙමින් සිටියදී ;

(ඇ) මත්පැන් හෝ මත්ද්‍රව්‍යවල බලපෑමක් යටතේ සිදුකෙරෙන දායකයාගේ ක්‍රියාවකින් ; හෝ

(ඈ) නීති විරෝධී ක්‍රියාවක් කිරීමට එරෙහිව යම් නීතියක් බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් ගනු ලබන නිවාරණ ක්‍රියාවලිවයකින්,

වන අවස්ථාවක, මේ නියෝග යටතේ ඒ දායකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුට එකවර ලැබෙන පාරිතෝෂිකය ගෙවනු නොලබන්නේය.

24. (1) යෝජනා ක්‍රමයේ දායකයකු විශ්‍රාම වැටුපක් ලැබීමෙන් අනතුරුව, එහෙත් වයස අවුරුදු අසූවට එළඹීමට පෙරාතුව, තමා විසින් නම් කරනු ලැබූ අයකු හෝ ඔහුගේ කලත්‍රයා ජීවත්ව සිටියදී මිය ගියහොත් එසේ නම් කරනු ලැබූ අයෙකු හෝ ඔහුගේ කලත්‍රයා යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක දායකයෙකු නොවේ නම්, යම් විශ්‍රාම වැටුපක් නොලබන්නේ නම් හෝ යම් විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබා ඇතිනම්, දායකයා ජීවත්ව සිටියේ නම් ඔහුට වයස අවුරුදු අසූව එළඹෙන දිනය හෝ එකී නම් කරනු ලැබූ අයෙකු හෝ ඔහුගේ කලත්‍රයා මිය යන දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය තෙක්, දායකයාට ගෙවිය යුතුව තිබූ විශ්‍රාම වැටුප ලබාගැනීමට, එසේ නම් කරනු ලැබූ අයකුට හෝ ඔහුගේ කලත්‍රයාට හිමිකමක් ඇත.

(2) 1 වන ඡෙදයේ සඳහන් කරනු ලැබූ දායකයකුගේ කලත්‍රයා හෝ නම් කරනු ලැබූ අයෙකු යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක දායකයෙකු වේනම්, යම් විශ්‍රාම වැටුපක් ලබන්නේ නම් හෝ යම් විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා ඇතිනම් එම ඡෙදයේ සඳහන් වූ පරිදි විශ්‍රාම වැටුප ලබාගැනීමට හිමිකම් ලැබූ දිනයවන විටදී, මණ්ඩලය විසින් අරමුදල වෙනුවෙන් උපයන ලද පොලි අනුපාතයෙන් ඒකක දෙකක් අඩුකර ලැබෙන අනුපාතයකට අනුව ගණනය කරනු ලබන පොලියක්ද සමඟ, දායකයා විසින් ගෙවන ලද ශුද්ධ දායක මුදල් ශේෂය ලැබීමට එම කලත්‍රයාට හෝ නම් කරනු ලැබූ අයකුට හිමිකම් ඇත.

(3) යෝජනා ක්‍රමයේ යම් දායකයෙකු විශ්‍රාම වැටුපක් ලැබීමෙන් පසුව එහෙත් වයස අවුරුදු අසූවක් සම්පූර්ණ කිරීමට පෙරාතුව සහ අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමෙන් තොරව මිය යන අවස්ථාවක, එසේ මියයන දිනය වන විටදී, අරමුදල වෙනුවෙන් මණ්ඩලය උපයන ලද පොලී අනුපාතයෙන් ඒකක දෙකක් අඩුකර ලැබෙන අනුපාතයට අනුව ගණනය කරනු ලබන පොලියද සමඟ දායකයා විසින් ගෙවන ලද ශුද්ධ දායක මුදලේ ශේෂය ලැබීමට, දායකයාගේ නීත්‍යානුකූල උරුමකරුවන් හට හිමිකම් ඇත.

(4) යෝජනා ක්‍රමයේ දායකයෙකු ස්ථිර පූර්ණ ආබාධිත දීමනාව ලබමින් සිටියදී වයස අවුරුදු අසූවක් සම්පූර්ණ කිරීමට ප්‍රථම මිය ගිය අවස්ථාවක, ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කරු දායකයාගේ ඒකාබද්ධ ශුද්ධ දායක මුදලේ ශේෂය සහ පූර්ණ ආබාධිත පාරිතෝෂික ශේෂය ලැබීමට හිමිකමක් ඇත.

25. මෙම නියෝගවල :-

"පනත" යන්නෙන්, 1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත අදහස් වේ ;

"බලයලත් නිලධරයා" යන්නෙන් යෝජනා ක්‍රමයේ කාර්ය සඳහා මණ්ඩලය විසින් යම් යම් ප්‍රදේශ වෙනුවෙන් පත් කරනලද නිලධරයෙකු අදහස් වේ.

"ඒකාබද්ධ ශුද්ධ දායක මුදලේ සහ පූර්ණ ආබාධිත පාරිතෝෂිකයේ ශේෂය" යන්නෙන්, ආබාධිත දීමනාව ගෙවීම සඳහා මේ තාක් භාවිතා කරන ලද මුදල අඩු කිරීමෙන් පසු ඉතිරිව තිබෙන ශේෂය අදහස් වේ. ;

"ශුද්ධ දායක මුදලේ ශේෂය" යනුවෙන් ශුද්ධ දායක මුදලින් මේ තාක් භාවිතා කරන ලද අඩුකිරීම් වලින් පසු ඉතිරිව තිබෙන ශේෂය අදහස් වේ. ;

"මණ්ඩලය" යන්නෙන්, පනතෙහි 2 වන වගන්තිය මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අදහස් වේ. ;

"යෝජනා ක්‍රමයේ දායකයකු"හෝ "දායකයකු" යන්නෙන්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සමන්විත වන කවර හෝ සැලසුමකට දායකයකු වූ තැනැත්තකු අදහස් වේ. ;

"අරමුදල" යන්නෙන්, පනතේ 21 වන වගන්තියෙහි සඳහන් අරමුදල අදහස් වේ. ;

"ශුද්ධ දායක මුදල" යන්නෙන්, දායකයාගේ දායක මුදල් වලින් පිහිටුවන ලද්දා වූ ද, විශ්‍රාම වැටුප් ගෙවීමේ කාර්යය සඳහා වෙන්කර ඇත්තාවූද මුදල් ප්‍රමාණය අදහස් වේ.

"පනත අදාළ වන තැනැත්තා" යන්නෙන් 1996 නොවැම්බර් මස 06 වන දින අංක 948/10 දින දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද නියෝගය මඟින් නිශ්චිතව සඳහන් කර ඇති වෘත්තියනට අදාළ යම් ස්වයං රැකියාවක හෝ අවිධිමත් අංශයක නියුතු තැනැත්තකු අදහස් වේ.

"ත්‍රෛමාසික" යන්නෙන්, ජනවාරි 01 දිනෙන්, අප්‍රේල් 01 දිනෙන්, ජූලි 01 දිනෙන් හා ඔක්තෝම්බර් 01 දිනෙන් ආරම්භ වන, මාස තුනක යම් කාලසීමාවක් අදහස් වේ ; සහ

"ත්‍රෛමාසික දායක මුදල" යන්නනේ, එක් එක් ත්‍රෛමාසිකය සඳහා ගෙවිය යුතු දායක මුදල අදහස් වේ.

26. 1997 ජනවාරි මස 03 වන දින අංක 956/13, 1997 සැප්තැම්බර් මස 05 වන දින අංක 991/28 සහ 1999 මාර්තු මස 11 වන දින අංක 1070/11 දරණ අති විශේෂ ගැසට්පත්‍රය මඟින් සංශෝධනය කරන ලද, 1996 නොවැම්බර් මස 22 වන දින අංක 950/14 දින දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද (ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා) විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ නියෝගය, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## "අ" උපලේඛනය "සහන"

| I වන තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ ළඟම උපන් දිනයට වයස (අවුරුදු) | II තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු ත්‍රෛමාසික වාරික මුදල (රුපියල්.) | III තීරුව<br>විශ්‍රාම වැටුප් හිමිවන තෙක් ගෙවිය යුතු ත්‍රෛමාසික වාරික සංඛ්‍යාව | IV තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳුනු විට සියළුම වාරික මුදල් එකවර ගෙවන්නේ නම් ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | V තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන දිනයේ සිට මාස 12 ක් තුල වාරික 4 කින් ගෙවීමේදී ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | VI තීරුව<br>හිමිවන මාසික විශ්‍රාම වැටුප (රු.) |
|---|---|---|---|---|---|
| 18 | 50 | 168 | 1920 | 497 | 2500 |
| 19 | 51 | 164 | 1940 | 502 | 2300 |
| 20 | 52 | 160 | 1965 | 509 | 2100 |
| 21 | 53 | 156 | 1985 | 514 | 1900 |
| 22 | 54 | 152 | 2005 | 519 | 1750 |
| 23 | 55 | 148 | 2020 | 523 | 1600 |
| 24 | 56 | 144 | 2040 | 528 | 1450 |
| 25 | 57 | 140 | 2055 | 532 | 1325 |
| 26 | 58 | 136 | 2070 | 536 | 1200 |
| 27 | 59 | 132 | 2080 | 539 | 1100 |
| 28 | 60 | 128 | 2095 | 543 | 1000 |
| 29 | 63 | 124 | 2175 | 563 | 950 |
| 30 | 66 | 120 | 2255 | 584 | 900 |
| 31 | 69 | 116 | 2330 | 603 | 850 |
| 32 | 73 | 112 | 2440 | 632 | 800 |
| 33 | 77 | 108 | 2515 | 651 | 750 |
| 34 | 81 | 104 | 2605 | 675 | 725 |
| 35 | 85 | 100 | 2695 | 698 | 700 |
| 36 | 88 | 96 | 2760 | 715 | 690 |
| 37 | 91 | 92 | 2820 | 730 | 680 |
| 38 | 96 | 88 | 2925 | 758 | 670 |
| 39 | 100 | 84 | 2975 | 771 | 660 |
| 40 | 104 | 80 | 3020 | 782 | 650 |
| 41 | 109 | 76 | 3095 | 802 | 640 |
| 42 | 114 | 72 | 3165 | 820 | 630 |
| 43 | 122 | 68 | 3305 | 856 | 620 |
| 44 | 128 | 64 | 3385 | 877 | 610 |
| 45 | 135 | 60 | 3445 | 892 | 600 |
| 46 | 144 | 56 | 3560 | 922 | 590 |
| 47 | 152 | 52 | 3615 | 936 | 580 |
| 48 | 163 | 48 | 3705 | 960 | 570 |
| 49 | 174 | 44 | 3755 | 973 | 560 |
| 50 | 180 | 40 | 3670 | 951 | 550 |
| 51 | 185 | 36 | 3545 | 918 | 540 |
| 52 | 192 | 32 | 3400 | 881 | 530 |
| 53 | 205 | 28 | 3315 | 859 | 520 |
| 54 | 220 | 24 | 3185 | 825 | 510 |
| 55-59 | 235 | 20 | 2955 | 765 | 500 |

## "ආ" උපලේඛනය

## අබලතාවය හා මරණය සිදුවූ විට ගෙවීම

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය | V වන තීරය |
|---|---|---|---|---|
| යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ උපන් දිනයට වයස (අවුරුදු වලින්) | අබලතාවය හෝ මරණය සිදුවන විට වයස | ස්ථිර වශයෙන් පූර්ණ ආබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය | ස්ථිර වශයෙන් අර්ධ ආබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය | මරණය සිදුවූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය |
| 18 සිට 54 දක්වා | අබලතාවය හෝ මරණය සිදුවන අවස්ථාවේ ඊළඟ උපන් දිනයට | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| | වයස | 50,000.00 | 25,000.00 | 25,000.00 |
| | 18 සිට 33 දක්වා | 40,000.00 | 20,000.00 | 20,000.00 |
| | 34 සිට 43 දක්වා | 30,000.00 | 15,000.00 | 15,000.00 |
| | 44 සිට 51 දක්වා | 20,000.00 | 10,000.00 | 10,000.00 |
| | 52 සිට 56 දක්වා | 16,000.00 | 8,000.00 | 8,000.00 |
| | 57 සිට 60 දක්වා | | | |
| 55 සිට 59 | සාමාජිකත්වය ප්‍රදානය කළ දිනයේ සිට දායක මුදල් ගෙවීමේ කාලසීමාවේ අවසානය දක්වා වූ කාලසීමාව තුළ | 12,000.00 | 6,000.00 | 6,000.00 |

## "ඇ" උපලේඛනය "තිළිණ"

## "තිළිණ" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

| I තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ ළඟම උපන් දිනට වයස (අවුරුදු) | II තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික මුදල (රුපියල්.) | III තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික සංඛ්‍යාව | IV තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳුනුවිට සියළුම වාරික මුදල් එකවර ගෙවන්නේ නම් ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | V තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන දිනයේ සිට මාස 12 ක් තුළ වාරික 4 කින් ගෙවීමේදී ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | VI තීරුව<br>හිමිවන මාසික විශ්‍රාම වැටුප (රුපියල්.) |
|---|---|---|---|---|---|
| 18 | 100 | 504 | 11817 | 3061 | 5000 |
| 19 | 102 | 492 | 12034 | 3117 | 4906 |
| 20 | 104 | 480 | 12248 | 3172 | 4812 |
| 21 | 106 | 468 | 12458 | 3227 | 4718 |
| 22 | 108 | 456 | 12665 | 3280 | 4624 |
| 23 | 110 | 444 | 12869 | 3333 | 4530 |
| 24 | 112 | 432 | 13067 | 3385 | 4436 |
| 25 | 114 | 420 | 13261 | 3435 | 4342 |
| 26 | 116 | 408 | 13449 | 3483 | 4248 |
| 27 | 118 | 396 | 13631 | 3530 | 4154 |

## "තිළිණ" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

| I තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ ළඟම උපන් දිනට වයස (අවුරුදු) | II තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික මුදල (රුපියල්.) | III තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාව | IV තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳුනුවිට සියළුම වාරික මුදල් එකවර ගෙවන්නේ නම් ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | V තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන දිනයේ සිට මාස 12 ක් තුළ වාරික 4 කින් ගෙවීමේදී ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්.) | VI තීරුව<br>හිමිවන මාසික විශ්‍රාම වැටුප (රුපියල්.) |
|---|---|---|---|---|---|
| 29 | 126 | 372 | 14430 | 3737 | 3966 |
| 30 | 132 | 360 | 15042 | 3896 | 3872 |
| 31 | 138 | 348 | 15638 | 4050 | 3778 |
| 32 | 146 | 336 | 16442 | 4259 | 3684 |
| 33 | 154 | 324 | 17224 | 4461 | 3590 |
| 34 | 162 | 312 | 17980 | 4657 | 3496 |
| 35 | 170 | 300 | 18708 | 4846 | 3402 |
| 36 | 176 | 288 | 19185 | 4969 | 3308 |
| 37 | 182 | 276 | 19629 | 5084 | 3214 |
| 38 | 192 | 264 | 20464 | 5300 | 3120 |
| 39 | 200 | 252 | 21035 | 5448 | 3026 |
| 40 | 208 | 240 | 21554 | 5583 | 2932 |
| 41 | 218 | 228 | 22216 | 5754 | 2838 |
| 42 | 228 | 216 | 22804 | 5906 | 2744 |
| 43 | 244 | 204 | 23893 | 6189 | 2650 |
| 44 | 256 | 192 | 24476 | 6340 | 2556 |
| 45 | 270 | 180 | 25126 | 6508 | 2462 |
| 46 | 288 | 168 | 25988 | 6731 | 2368 |
| 47 | 304 | 156 | 26484 | 6860 | 2274 |
| 48 | 326 | 144 | 27279 | 7065 | 2180 |
| 49 | 328 | 132 | 26198 | 6786 | 2086 |
| 50 | 360 | 120 | 27242 | 7056 | 1992 |
| 51 | 370 | 108 | 26781 | 6807 | 1898 |
| 52 | 384 | 96 | 25306 | 6554 | 1804 |
| 53 | 410 | 84 | 24697 | 6397 | 1710 |
| 54 | 440 | 72 | 23751 | 6152 | 1616 |
| 55 | 470 | 60 | 22121 | 5729 | 1522 |
| 56-59 | 470 | 60 | 22121 | 5729 | 1500 |

# "ඈ" උපලේඛනය "ඉසුරු"

| I තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ උපන් දිනයට වයස | II තීරුව<br>විශ්‍රාම වැටුප් හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික මුදල (රුපියල්) | III තීරුව<br>විශ්‍රාම වැටුප හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික සංඛ්‍යාව | IV තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳුනුවිට සියළුම වාරික මුදල් එකවර ගෙවන්නේ නම් ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්) | V තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන දිනයේ සිට මාසික වාරික 12 කින් එකවර ගෙවන මුදල ගෙවන්නේ නම් ගෙවිය යුතු වාරික මුදල (රුපියල්.) | VI තීරුව<br>හිමිවන මාසික විශ්‍රාම වැටුප (රුපියල්.) |
|---|---|---|---|---|---|
| 18 | 155 | 504 | 22,402 | 1,936 | 8,000 |
| 19 | 165 | 492 | 23,997 | 2,074 | 7,878 |
| 20 | 176 | 480 | 25,532 | 2,206 | 7,756 |
| 21 | 188 | 468 | 27,162 | 2,347 | 7,634 |
| 22 | 201 | 456 | 28,892 | 2,497 | 7,512 |
| 23 | 215 | 444 | 30,727 | 2,655 | 7,390 |
| 24 | 229 | 432 | 32,673 | 2,823 | 7,268 |
| 25 | 245 | 420 | 34,737 | 3,002 | 7,146 |
| 26 | 262 | 408 | 36,925 | 3,191 | 7,024 |
| 27 | 280 | 396 | 39,243 | 3,391 | 6,902 |
| 28 | 300 | 384 | 41,699 | 3,603 | 6,780 |
| 29 | 320 | 372 | 44,300 | 3,828 | 6,658 |
| 30 | 343 | 360 | 47,052 | 4,066 | 6,536 |
| 31 | 367 | 348 | 49,965 | 4,318 | 6,414 |
| 32 | 392 | 336 | 52,793 | 4,562 | 6,292 |
| 33 | 420 | 324 | 56,037 | 4,842 | 6,170 |
| 34 | 450 | 312 | 59,465 | 5,139 | 6,048 |
| 35 | 484 | 300 | 63,086 | 5,451 | 5,926 |
| 36 | 520 | 288 | 66,908 | 5,782 | 5,804 |
| 37 | 559 | 276 | 70,941 | 6,130 | 5,682 |
| 38 | 602 | 264 | 75,195 | 6,498 | 5,560 |
| 39 | 649 | 252 | 79,677 | 6,885 | 5,438 |
| 40 | 701 | 240 | 84,398 | 7,293 | 5,316 |
| 41 | 759 | 228 | 89,367 | 7,722 | 5,194 |
| 42 | 819 | 216 | 94,189 | 8,139 | 5,072 |
| 43 | 889 | 204 | 99,667 | 8,612 | 4,950 |
| 44 | 969 | 192 | 105,420 | 9,110 | 4,828 |
| 45 | 1,058 | 180 | 111,457 | 9,631 | 4,706 |
| 46 | 1,160 | 168 | 117,788 | 10,178 | 4,584 |
| 47 | 1,277 | 156 | 124,417 | 10,751 | 4,462 |
| 48 | 1412 | 144 | 131,353 | 11,351 | 4,340 |
| 49 | 1,572 | 132 | 138,599 | 11,977 | 4,218 |
| 50 | 1,756 | 120 | 145,680 | 12,589 | 4,096 |
| 51 | 1,986 | 108 | 153,560 | 13,269 | 3,974 |
| 52 | 2,272 | 96 | 161,757 | 13,978 | 3,852 |
| 53 | 2,636 | 84 | 170,268 | 14,713 | 3,730 |
| 54 | 3,120 | 72 | 179,126 | 15,479 | 3,608 |
| 55 | 3,792 | 60 | 188,273 | 16,269 | 3,486 |
| 56 | 3,647 | 60 | 181,066 | 15,646 | 3,364 |
| 57 | 3,502 | 60 | 173,853 | 15,023 | 3,242 |
| 58 | 3,334 | 60 | 165,523 | 14,303 | 3,120 |
| 59 | 3,403 | 60 | 168,936 | 14,598 | 3,000 |

## "ඉ" උපලේඛනය "සරණ"

| I තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථා වේදී ඊළඟ උපන් දිනයට වයස (අවුරුදු) | II තීරුව<br>විශ්‍රාම වැටුප් හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික මුදල (රුපියල්) | III තීරුව<br>විශ්‍රාම වැටුප් හිමිවන තෙක් ගෙවිය යුතු මාසික වාරික සංඛ්‍යාව | IV තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳුනු විට සියළුම වාරික මුදල් එකවර ගෙවන්නේ නම් ගෙවිය යුතු මුළු වාරික මුදල (රුපියල්) | V තීරුව<br>යෝජනා ක්‍රමයට බැඳෙන දිනයේ සිට මාසික වාරික 12 ක් එකවර ගෙවන මුදල ගෙවන්නේ වාරික මුදල (රුපියල්.) | VI තීරුව<br>හිමිවන මාසික විශ්‍රාම වැටුප (රු.) |
|---|---|---|---|---|---|
| 18 | 125 | 504 | 14,726 | 1350 | 6000 |
| 19 | 140 | 492 | 16,463 | 1509 | 5850 |
| 20 | 155 | 480 | 18,189 | 1667 | 5700 |
| 21 | 170 | 468 | 19,904 | 1825 | 5550 |
| 22 | 185 | 456 | 21,606 | 1981 | 5400 |
| 23 | 200 | 444 | 23,294 | 2135 | 5250 |
| 24 | 215 | 432 | 24,965 | 2288 | 5100 |
| 25 | 230 | 420 | 26,618 | 2440 | 4950 |
| 26 | 245 | 408 | 28,249 | 2590 | 4800 |
| 27 | 260 | 396 | 29,857 | 2737 | 4650 |
| 28 | 275 | 384 | 31,437 | 2882 | 4500 |
| 29 | 290 | 372 | 32,987 | 3024 | 4350 |
| 30 | 305 | 360 | 34,503 | 3163 | 4200 |
| 31 | 320 | 348 | 35,979 | 3298 | 4050 |
| 32 | 335 | 336 | 37,412 | 3429 | 3900 |
| 33 | 350 | 324 | 38,796 | 3556 | 3750 |
| 34 | 365 | 312 | 40,125 | 3678 | 3600 |
| 35 | 380 | 300 | 41,391 | 3794 | 3450 |
| 36 | 395 | 288 | 42,588 | 3904 | 3300 |
| 37 | 410 | 276 | 43,705 | 4006 | 3150 |
| 38 | 425 | 264 | 44,735 | 4101 | 3000 |
| 39 | 440 | 252 | 45,665 | 4186 | 2850 |
| 40 | 455 | 240 | 46,484 | 4261 | 2700 |
| 41 | 480 | 228 | 48,182 | 4417 | 2550 |
| 42 | 505 | 216 | 49,701 | 4556 | 2400 |
| 43 | 530 | 204 | 51,017 | 4677 | 2250 |
| 44 | 555 | 192 | 52,106 | 4776 | 2100 |
| 45 | 580 | 180 | 52,938 | 4853 | 1950 |
| 46 | 620 | 168 | 54,808 | 5024 | 1800 |
| 47 | 660 | 156 | 56,259 | 5157 | 1750 |
| 48 | 700 | 144 | 57,235 | 5247 | 1700 |
| 49 | 740 | 132 | 57,676 | 5287 | 1650 |
| 50 | 800 | 120 | 58,988 | 5407 | 1600 |
| 51 | 850 | 108 | 58,742 | 5385 | 1600 |
| 52 | 900 | 96 | 57,617 | 5282 | 1600 |
| 53 | 950 | 84 | 55,500 | 5087 | 1600 |
| 54 | 1000 | 72 | 52,263 | 4791 | 1600 |
| 55-59 | 1050 | 60 | 61,364 | 5167 | 1600 |

## "ඊ" උපලේඛනය "සුරැකුම"

| I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව | V තීරුව | VI තීරුව | VII තීරුව | VIII තීරුව | IX තීරුව | X තීරුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| වයස | මාසික විශ්‍රාම වැටුප<br>රු. | මාසික වාරිකය<br>රු. | ත්‍රෛ මාසික වාරිකය | වසර 25ක් තුළදී වාර්ෂික වාරික 25කින්<br>රු | වසර 20ක් තුළදී වාර්ෂික වාරික 20කින්<br>රු | වසර 15ක් තුළදී වාර්ෂික වාරික 15කින් | වසර 10ක් තුළදී වාර්ෂික වාරික 10කින්<br>රු | වසර 5ක් තුළදී වාර්ෂික වාරික 5කින්<br>රු | තනි වාරිකය<br>රු. |
| 18 | 1000 | 40 | 100 | 400 | 425 | 475 | 575 | 925 | 3800 |
| 19 | 1000 | 40 | 110 | 425 | 450 | 500 | 625 | 1000 | 4100 |
| 20 | 1000 | 40 | 120 | 475 | 500 | 550 | 675 | 1100 | 4500 |
| 21 | 1000 | 50 | 130 | 525 | 550 | 600 | 750 | 1200 | 4900 |
| 22 | 1000 | 50 | 140 | 575 | 600 | 650 | 800 | 1300 | 5300 |
| 23 | 1000 | 50 | 150 | 625 | 650 | 725 | 875 | 1425 | 5800 |
| 24 | 1000 | 60 | 170 | 675 | 700 | 775 | 975 | 1550 | 6300 |
| 25 | 1000 | 60 | 180 | 725 | 775 | 850 | 1050 | 1700 | 6900 |
| 26 | 1000 | 70 | 200 | 800 | 850 | 925 | 1150 | 1850 | 7500 |
| 27 | 1000 | 80 | 220 | 875 | 925 | 1025 | 1250 | 2025 | 8200 |
| 28 | 1000 | 80 | 240 | 950 | 1000 | 1100 | 1375 | 2200 | 8900 |
| 29 | 1000 | 90 | 260 | 1025 | 1100 | 1200 | 1475 | 2400 | 9700 |
| 30 | 1000 | 100 | 290 | 1125 | 1200 | 1325 | 1625 | 2625 | 10600 |
| 31 | 1000 | 100 | 300 | 1225 | 1300 | 1450 | 1775 | 2850 | 11600 |
| 32 | 1000 | 110 | 330 | 1350 | 1425 | 1575 | 1925 | 3125 | 12600 |
| 33 | 1000 | 130 | 370 | 1475 | 1550 | 1700 | 2100 | 3400 | 13800 |
| 34 | 1000 | 140 | 400 | 1600 | 1675 | 1875 | 2300 | 3700 | 15000 |
| 35 | 1000 | 150 | 450 | 1750 | 1850 | 2050 | 2500 | 4050 | 16400 |
| 36 | 1000 | 170 | 490 | | 2000 | 2225 | 2750 | 4425 | 17900 |
| 37 | 1000 | 190 | 550 | | 2200 | 2425 | 3000 | 4825 | 19500 |
| 38 | 1000 | 210 | 610 | | 2400 | 2650 | 3275 | 5275 | 21300 |
| 39 | 1000 | 230 | 680 | | 2625 | 2900 | 3575 | 5750 | 23300 |
| 40 | 1000 | 260 | 750 | | 2875 | 3175 | 3900 | 6275 | 25400 |
| 41 | 1000 | 290 | 840 | | | 3475 | 4250 | 6875 | 27800 |
| 42 | 1000 | 320 | 940 | | | 3800 | 4650 | 7500 | 30300 |
| 43 | 1000 | 360 | 1060 | | | 4175 | 5100 | 8200 | 33100 |
| 44 | 1000 | 400 | 1190 | | | 4575 | 5575 | 8975 | 36200 |
| 45 | 1000 | 440 | 1290 | | | 5000 | 6100 | 9800 | 39600 |
| 46 | 1000 | 500 | 1470 | | | | 6700 | 10750 | 43300 |
| 47 | 1000 | 500 | 1470 | | | | 6700 | 10750 | 43300 |
| 48 | 1000 | 570 | 1680 | | | | 7325 | 11750 | 47400 |
| 49 | 1000 | 650 | 1940 | | | | 8050 | 12875 | 51800 |
| 50 | 1000 | 760 | 2250 | | | | 8825 | 14125 | 56800 |
| 51 | 1000 | 810 | 2410 | | | | | 15475 | 62200 |
| 52 | 1000 | 960 | 2860 | | | | | 16975 | 68200 |
| 53 | 1000 | 1160 | 3450 | | | | | 18650 | 74800 |
| 54 | 1000 | 1430 | 4240 | | | | | 20500 | 82000 |
| 55 | 1000 | 1800 | 5350 | | | | | 22550 | 90100 |
| 56 | 1000 | 2370 | 7040 | | | | | | 99000 |
| 57 | 1000 | 3320 | 9870 | | | | | | 108900 |
| 58 | 1000 | 5240 | 15570 | | | | | | 119900 |
| 59 | 1000 | 11000 | 32730 | | | | | | 132100 |

## "උ" උපලේඛනය "ධනලක්ෂ්මි"

| I තීරුව වයස | II තීරුව මාසික විශ්‍රාම වැටුප | III තීරුව මාසික වාරික | IV තීරුව ත්‍රෛයි මාසික වාරික | V තීරුව වසර 25ක්තුළදී වාර්ෂික වාරික25 න් | VI තීරුව වසර 20ක තුළදී වාර්ෂිකවාරික20න් | VII තීරුව වසර 15ක්තුළදී වාර්ෂික වාරික15න් | VIII තීරුව වසර 10ක් තුළදී වාර්ෂික වාරික 10න් | IX තීරුව වසර 5ක්තුළදී වාර්ෂික වාරික5න් | X තීරුව තනි වාරිකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | 1000 | 90 | 250 | 1150 | 1250 | 1450 | 1875 | 3200 | 13700 |
| 19 | 1000 | 90 | 270 | 1200 | 1325 | 1525 | 1975 | 3400 | 14500 |
| 20 | 1000 | 100 | 290 | 1275 | 1400 | 1625 | 2100 | 3600 | 15400 |
| 21 | 1000 | 110 | 310 | 1375 | 1500 | 1725 | 2225 | 3825 | 16300 |
| 22 | 1000 | 110 | 330 | 1450 | 1575 | 1825 | 2375 | 4050 | 17300 |
| 23 | 1000 | 120 | 350 | 1525 | 1675 | 1950 | 2525 | 4300 | 18400 |
| 24 | 1000 | 130 | 380 | 1625 | 1775 | 2075 | 2675 | 4575 | 19500 |
| 25 | 1000 | 140 | 400 | 1725 | 1900 | 2200 | 2825 | 4850 | 20700 |
| 26 | 1000 | 150 | 430 | 1825 | 2000 | 2325 | 3000 | 5150 | 22000 |
| 27 | 1000 | 160 | 460 | 1950 | 2125 | 2475 | 3175 | 5450 | 23300 |
| 28 | 1000 | 170 | 490 | 2075 | 2250 | 2625 | 3375 | 5800 | 24700 |
| 29 | 1000 | 180 | 530 | 2200 | 2400 | 2775 | 3600 | 6150 | 26200 |
| 30 | 1000 | 190 | 570 | 2325 | 2550 | 2950 | 3800 | 6525 | 27800 |
| 31 | 1000 | 200 | 590 | 2475 | 2700 | 3125 | 4050 | 6925 | 29500 |
| 32 | 1000 | 210 | 630 | 2625 | 2875 | 3325 | 4300 | 7350 | 31300 |
| 33 | 1000 | 230 | 680 | 2800 | 3050 | 3525 | 4550 | 7800 | 33200 |
| 34 | 1000 | 250 | 730 | 2975 | 3250 | 3750 | 4825 | 8275 | 35300 |
| 35 | 1000 | 270 | 790 | 3175 | 3450 | 3975 | 5125 | 8775 | 37400 |
| 36 | 1000 | 290 | 860 | | 3650 | 4225 | 5450 | 9325 | 39700 |
| 37 | 1000 | 310 | 930 | | 3900 | 4500 | 5800 | 9900 | 42200 |
| 38 | 1000 | 340 | 1010 | | 4150 | 4775 | 6150 | 10500 | 44800 |
| 39 | 1000 | 370 | 1090 | | 4400 | 5075 | 6525 | 11150 | 47500 |
| 40 | 1000 | 400 | 1190 | | 4700 | 5400 | 6950 | 11850 | 50500 |
| 41 | 1000 | 440 | 1300 | | | 5750 | 7400 | 12600 | 53600 |
| 42 | 1000 | 480 | 1430 | | | 6125 | 7850 | 13400 | 57000 |
| 43 | 1000 | 530 | 1570 | | | 6525 | 8375 | 14225 | 60600 |
| 44 | 1000 | 580 | 1730 | | | 6950 | 8900 | 15150 | 64400 |
| 45 | 1000 | 620 | 1840 | | | 7400 | 9475 | 16100 | 68400 |
| 46 | 1000 | 690 | 2040 | | | | 10100 | 17150 | 72800 |
| 47 | 1000 | 690 | 2040 | | | | 10100 | 17150 | 72800 |
| 48 | 1000 | 860 | 2560 | | | | 11500 | 19450 | 82400 |
| 49 | 1000 | 970 | 2900 | | | | 12275 | 20725 | 87800 |
| 50 | 1000 | 1110 | 3300 | | | | 13100 | 22125 | 93500 |
| 51 | 1000 | 1170 | 3490 | | | | | 23600 | 99700 |
| 52 | 1000 | 1370 | 4070 | | | | | 25200 | 106300 |
| 53 | 1000 | 1620 | 4820 | | | | | 26950 | 113500 |
| 54 | 1000 | 1960 | 5830 | | | | | 28825 | 121200 |
| 55 | 1000 | 2430 | 7250 | | | | | 30850 | 129500 |
| 56 | 1000 | 3150 | 9400 | | | | | | 138600 |
| 57 | 1000 | 4360 | 12990 | | | | | | 148300 |
| 58 | 1000 | 6770 | 20190 | | | | | | 159000 |
| 59 | 1000 | 14040 | 41850 | | | | | | 170500 |